# විශේෂ නිවේදනයයි.

**ඊශ්‍රායලයේ වාසය කරන සියළුම ශ්‍රී ලාංකිකයින් වෙත,**

**<u>ශ්‍රී ලංකාවට පැමිණෙන ජාත්‍යන්තර මගී ගුවන් ගමන් අවලංගු කිරීම</u>**

ශ්‍රී ලංකාව තුල කොරෝනා වසංගතය පැතිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා තානාපති කාර්යාලය විසින් මීට පෙර නිකුත් කරන ලද නිවේදනවලට වැඩිමනත් වශයෙනි.

ශ්‍රී ලංකාව තුල ව්‍යාප්ත වන කොරෝනා වසංගත තත්වය පාලනය කිරීම පිණිස, ශ්‍රී ලංකාවට පැමිණෙන සියළුම ජාත්‍යන්තර මගී ගුවන් ගමන් 2021.05.21 දින රාත්‍රී 11.59 සිට 2021.05.31 දින රාත්‍රී 11.59 දක්වා තාවකාලිකව අවලංගු කර ඇති බව ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය දන්වා ඇත.

ශ්‍රී ලංකාවේ සිට විදේශයන් බලා පිටත්වන ගුවන් ගමන් සඳහා ඉහත සඳහන් කොන්දේසිය අදාල නොවන බව ද ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය වැඩිදුරටත් දන්වා සිටී.

**ශ්‍රී ලංකා තානාපති කාර්යාලය**
**ටෙල් අවිව්, ඊශ්‍රායලය**

2021.05.19